www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අධිරාජ්‍යවාදය මැන්ඩෙලා වෙනුවෙන් වැලපෙන්නේ මන් ද

## Why imperialism mourns Mandela

**2013 දෙසැම්බර් 07**

95 වසරක ආයු කාලයෙන් පසුව සිදුවූ නෙල්සන් මැන්ඩෙලාගේ අභාවය, පෙර නොවූ විරූ ආකාරයේ ලෝක පරිමාන ශෝකය පල කරන ව්‍යායාමයකට හේතුවී තිබේ.

දකුනු අප්‍රිකාවේ හා ජාත්‍යන්තරව වැඩකරන ජනතාව, වෛරයට පාත්‍රවූ ඇපාතයිඩ් තන්ත්‍රය යටතේ නීති විරෝධී තත්වය, වධ බන්ධන හා සිරගත කිරීමේ සිය වසර ගනනාවක් දීර්ග කාලය තුල, අප්‍රිකානු ජාතික සංගමයේ නායකයා විසින් ප්‍රදර්ශනය කල ධෛර්ය හා කැපකිරීම කෙරෙහි මෙන්ම නිදහස සඳහා සිය ජීවිත පරිත්‍යාග කල තවත් දහස් ගනනක් කෙරෙහි ගෞරවය පලකරනවා නිසැකය.

කෙසේ වුවත්, ලොව වටා ධනපති ආන්ඩු හා ව්‍යාපාර පාලිත මාධ්‍ය, ශෝකය පලකිරීමට තදියම්වී ඇත්තේ, තමන්ගේම හේතු කාරනා ඇතිවය. මෙයට, අඩ සියවසකට පෙර මැන්ඩෙලා 'ත්‍රස්තවාදියෙකු' ලෙස අල්ලා සිරගත කිරීමට හා දකුනු අප්‍රිකාවේ ඇපාතයිඩ් පාලනයට සහාය දුන් රාජ්‍ය නායකයින් ද ඇතුලත්ය.

මිලියන එකහමාරකට වැඩි මිනිසුන් යකඩ වැටවල් පිටුපස රඳවා ඇති එක්සත් ජනපද බන්ධනාගාර පද්ධතිය හා ගුවන්තනාමෝ වධකාගාරය මත ජනාධිපති ලෙස වැජඹෙන බැරැක් ඔබාමා, රොබෙන් දිවයින්හි වසර 27ක් ගතකල පුද්ගලයා කෙරෙන් 'ආවේශය ලබාගත් මිලියන ගනනකින් එක් අයෙක්' තමා බව ප්‍රකාශ කල නිවේදනයක් නිකුත් කලේය.

දක්ෂිනාංශික ටෝරි පක්ෂයේ ප්‍රමිතිගත භාරකරු වන බ්‍රිතාන්‍ය අගමැති ඩේවිඩ් කැමරන්, ඩවුනිං වීදියේ අංක 10 දරන ස්ථානය ඉදිරිපස කොඩිය අඩකුඹු කිරීමට නියම කලේය. මැන්ඩෙලා වනාහි, 'අපගේ කාලයේ කුලුනක් වන් චරිතයක්, දැන් මලවුන් අතර වුවත්, ජීවිතයේ පුරාවෘතයක්, සැබෑ ගෝලීය වීරයෙක්' යයි ඔහු ප්‍රකාශ කලේය.

නිව් යෝර්ක් නගරයේ කොඩි අඩකුඹු කිරීමට නියෝග කල මයිකල් බ්ලුම්බර්ග්, හා බිල් ගේට්ස් වැනි ප්‍රකෝටිපතියන්ට ද තමන්ගේම ප්‍රකාශ නිකුත් කිරීමට බලකෙරෙන බවක් දැනී තිබුනි.

මැන්ඩෙලා අභාවයට පත් අවස්ථාව පිලිබඳව මාධ්‍යය විසින් පලකරන බකතපස් කෙලතොලුකම තුල පවතින සැලකිය යුතු දෙය නම්, දකුනු අප්‍රිකාවේ ඉතිහාසය හා දේශපාලනය සමග නොවෙන්කල හැකි පරිදි බැඳී ඇති මිනිසෙකුගේ ජීවිතය, මුලුමනින්ම අදේශපාලනික සුරුවමක් බවටත්, ඔබාමාගේ වචන වලින් කිවූ පරිදි 'මෙහෙයවුනේ වෛරය තුලින් නොව ආදරය තුලිනි' යන අයුරින් බදාම ශාන්තුවරයෙක් බවටත් හැරවීමයි.

රටක් රටක් පාසා ධනපති කතිපයාධිකාරීන් මැන්ඩෙලාගේ මරනය තුල සැබවින්ම වැලපෙන දේ කුමක් ද? පැහැදිලිවම එය පීඩාකාරී පද්ධතියකට ප්‍රතිරෝධය දැක්වීමේ ඔහුගේ අධිෂ්ඨානය නම් නොවේ. ඒ වනාහි සිරගත කිරීමත් හෝ ඩ්‍රෝන් මිසයිල ඝාතනයකින් දඬුවම් කිරීමට ඔවුන් සියල්ලන්ම සූදානම්ව සිටින යමකි.

ඒ වෙනුවට පිලිතුර සොයාගත යුත්තේ, දකුනු අප්‍රිකාව වෙලාගෙන ඇති වත්මන් සමාජ හා දේශපාලන අර්බුදය තුලිනි. එසේම, අතිශයින්ම පුපුරන සුලු කොන්දේසි යටතේ පැවති රට තුල, ධනපති අවශ්‍යතා සුරැකීමට මැන්ඩෙලා ඉටුකල ඓතිහාසික භූමිකාව තුලය.

මැන්ඩෙලාගේ මරනයට දිනකට පෙර, යුක්තිය හා ප්‍රතිසන්ධානය සඳහා වන දකුනු අප්‍රිකානු ආයතනය සමීක්ෂනය කලවුන්ගෙන් අති මහත් බහුතරයක්, දකුනු අප්‍රිකානු සමාජය තුල අතිමූලික ප්‍රශ්නය වන්නේ, පන්ති අසමානතාවය බව සඳහන් කෙරෙන වාර්ෂික වාර්තාවක් නිකුත් කිරීම වැදගත්ය. 'ජාතික ප්‍රතිසන්ධානයට ඇති ප්‍රධානතම බාධකය' පන්තියට ප්‍රතිකූලව වර්ගය බව ඔවුහු සටහන් කර තිබේ. එය සියයට 14.6ට එරෙහිව සියයට 27.9ක් තරම් වන දෙගුනයක මත පලකිරීමකි.

ඇපාතයිඩ්හි නීත්‍යානුකූල වාර්ගික පීඩාව අවසන් වීමෙන් දශක දෙකකට පසුව, දකුනු අප්‍රිකාව තුල පන්ති ප්‍රශ්නය පෙරමුනට පැමින තිබේ. අප්‍රිකානු ජාතික සංගමය සමග ඍජු ගැටුමක් බවට පත්වූ පතල් කම්කරුවන්ගේ හා කම්කරු පන්තියේ අනෙකුත් කොටස්වල දිරිමත් මහජන අරගල තුල මෙය ප්‍රකාශයට පත්විය.

මෙම නැගිටීම්වල තියුනුම ප්‍රකාශනය අත්කර ගත්තේ, 2012 අගෝස්තු 16දා මරිකානාහි ලොන්මින් ප්ලැටිනම් පතලේ වැඩවර්ජනය කල කම්කරුවන් 34ක් ඝාතනය කිරීම තුලය. එම ලේවැකි ජනඝාතනය සිහියට නැංවූයේ සොවේටෝ හා ෂාපවිල්හි ඇපාතයිඩ් සංහාරය පිලිබඳ කටුක සිදුවීම්ය. කෙසේ නමුත් මෙවර ලේ හැලීම සූදානම් කලේ, ඒඑන්සී ආන්ඩුව හා එහි සහචර කොසාටු යන නිල වෘත්තීය සමිති සංගමය විසිනි.

මෙම ග්‍රහ ලෝකය මුහුනත ඇති සමාජීයව ඉතාමත් අසමානවූ රට ලෙස අද දකුනු අප්‍රිකාව වර්ගකර තිබේ. ධනය හා දුගී භාවය අතර පරතරයත්, දුප්පත් දකුනු අප්‍රිකානුවන්ගේ සංඛ්‍යාවත් යන දෙකම, මැන්ඩෙලා සිරගෙයින් පිටතට පැමිනි 1990දී පැවතියාට වඩා බෙහෙවින් වැඩිය. රටේ මුලු ආදායමෙන් සියයට 60ක් හිමිකර ගන්නේ ජනගහනයේ ඉහලම සියයට 10 විසිනි. පහතම සියයට 50 ජීවත් වන්නේ, දරිද්‍රතා රේඛාවෙන් පහලය. ඔවුන් සාමූහිකව හිමිකර ගන්නේ මුලු ඉපැයුම්

වලින් සියයට 8ට අඩුවෙනි. තරුනයින්ගෙන් සියයට 50ක් ද ඇතුලු මිලියන 20ක් වත් රැකියා විරහිතය.

මේ අතර 'කලු ආර්ථික බලය පැවරීම' වැනි වැඩසටහන් වල කඩතුරාව යටතේ, හිටපු කලූ ජාතික ඒඑන්සී නායකයින්, වෘත්තීය සමිති නිලධරයින් හා කුඩා ව්‍යාපාරිකයින්ගේ තුනී ස්ථරයක්, අධ්‍යක්ෂ මන්ඩල වලට පත්වීම, ව්‍යාපාරික වස්තු අත්කර ගැනීම, ආන්ඩුවේ කොන්ත්‍රාත් හිමිකර ගැනීම තුලින් බෙහෙවින් ධනවත්වී ඇත. මැන්ඩෙලාගෙන් පසුව පලමුව පැමිනි තබෝ උම්බෙකි හා දැන් ජැකොබ් සූමාගේ නායකත්වයෙන් යුත් ඒඑන්සී ආන්ඩු, ධනවත් පාලන සංස්ථාපිතයේ දූෂිත නියෝජිතයින් ලෙස දර්ශනය වීමට පටන්ගෙන ඇත්තේ මේ තත්වයන් යටතේය.

තමන්ගේ දූෂිත ගනුදෙනු සඟවා ගැනීම සඳහා මැන්ඩෙලාගේ කැපවීමේ ඉතිහාසය හා ඔහුගේ නිහතමානී, අභිමානවත් පෞරුෂය ගසාකන ඒඑන්සීයේ මූනත්තහඩුව ලෙස සේවය කල ඔහු, රටේ දේශපාලන ජීවිතය තුල ඉටු කලේ එන්ට එන්ටම අඩු ක්‍රියාශීලී භූමිකාවකි. සැබවින්ම එම මූනත්තහඩුවට පිටුපසින් මැන්ඩෙලා හා ඔහුගේ පවුල මිලියන ගනන් උපයා ගත්හ. ඔහුගේ දරුවන් හා මුනුපුරන් පෞද්ගලික සමාගම් 200ක පමන ක්‍රියාත්මකව සිටියි.

*නිව් යොර්ක් ටයිම්ස්* පත්‍රය 06දා 'මැන්ඩෙලාගේ අභාවය දකුනු අප්‍රිකාවට සිය සදාචාරාත්මක මධ්‍යස්ථානය අහිමි කලේය' යන හිසින් යුත් ශෝක හරිත විලාසයක් පාන ලිපියක් පල කලේය. සත්තකින්ම, උත්සන්න වන පන්ති අරගලය හමුවේ මැන්ඩෙලාගේ අවසානයත් සමග, ඒඑන්සීයට යම් හෝ විශ්වාසනීයත්වයක් තිබුනේ නම් එය ද අවලංගුවී යනු ඇති බවට බියක් පවතියි.

දකුනු අප්‍රිකාවේ වත්මන් අර්බුදය හමුවේ, මැන්ඩෙලාගේ අවසානයෙහි ඇඟවුම් පිලිබඳව ධනපති ආන්ඩුවල හා ව්‍යාපාරික කතිපයාධිකාරීන්ගේ කනස්සල්ල බැඳී ඇත්තේ, හිටපු ජනාධිපති හා ඒඑන්සීයේ නායකයා ඉටුකල සේවය සඳහා පල වන උපහාර දැක්වීමක් සමගය. ඇපාතයිඩ් අවසන් කිරීම පිලිබඳව මැන්ඩෙලා හා ඒඑන්සීය සමග දකුනු අප්‍රිකානු පාලක පන්තිය සාකච්ඡා ආරම්භකල 1980 ගනන් වල මැද, එරට පැවතුනේ දරුනු ආර්ථික අර්බුදයක හා සිවිල් යුද්ධයක් පුපුරා යාමේ අද්දරය. කලු කම්කරු පන්තික නාගරිකයන්හි පාලනය සියතින් ගිලිහී ගොස් තිබුනු තතු හමුවේ ආන්ඩුවට, හදිසි නීතිය පැනවීමට බල කෙරුනි.

ජාත්‍යන්තර හා දකුනු අප්‍රිකානු පතල් සමාගම් ද බැංකු හා අනෙකුත් ව්‍යාපාරික ආයතන ද සමග එක්වූ ඇපාතයිඩ් පාලනයේ වඩාත් දැනුවත් කොටස්, විප්ලවවාදී නැගිටීමක් මැඩපැවැත්වීමේ හැකියාව ඇත්තේ, විශේෂයෙන්ම මැන්ඩෙලා හා ඒඑන්සීයට පමනක් බව වටහා ගත්හ. වසර 23කට පෙර ඔහු සිරභාරයෙන් නිදහස් කලේ එම කර්තව්‍යය සඳහා ය.

සන්නද්ධ අරගලය හා සමාජවාදී වාචාලය සමග වූ බැඳීම තුලින් අත්කර ගෙන තිබූ කීර්තිය ගසාකමින් ඒඑන්සීය, ජාත්‍යන්තර ව්‍යාපාරයන්ගේ හා රටේ සුදු ධනපති පාලකයන්ගේ ධනය හා දේපොල සුරක්ෂිත කල, සාකච්ඡාමය විසඳුමක් තුලින්, තමන්ට පාලනයක් හෝ එයට කැමැත්තක් හෝ නොතිබූ නැගිටීමේ ගෙල සිරකිරීමට වැඩ කලේය.

බලයට ඒමට පෙරාතුව මැන්ඩෙලා හා ඒඑන්සීය, සිය ව්‍යාපාරයේ ක්‍රියාමාර්ගයෙහි විශාල කොටස් අතහැර දැමූහ. විශේෂයෙන්ම, බැංකුවල, පතල් වල හා මූලික කර්මාන්තවල පොදු අයිතියට සම්බන්ධ ක්ෂේත්‍ර ඒ අතර විය. දරුනු අයවැය කප්පාදු, ඉහල පොලී අනුපාතික හා ජාත්‍යන්තර ප්‍රාග්ධනයට විනිවිදීම සඳහා පැවති සියලු බාධක ඉවත් කිරීම ඇතුලු නිදහස් වෙලඳපොල ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන බවට පොරොන්දු දෙමින් ඔවුහු, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග අරමුනු පිලිබඳ රහසිගත ලිපියකට අත්සන් තැබූහ.

එසේ කිරීමේදී මැන්ඩෙලාට, තමන් දශක හතරකට පමන පෙර දරා සිටි දෘෂ්ටිය සිහියට නැගුනු අතර ඔහු ඒඑන්සීයේ ක්‍රියාමාර්ගය බලගැන්වීමෙහි අර්ථය, 'මෙරටේ ඉතිහාසය තුල පලමු වතාවට, යුරෝපීය නොවන ධනේශ්වරයට සිය නමෙන්ම මෝල් හා කර්මාන්තශාලාවල ද වෙලඳාමේ හා පෞද්ගලික ව්‍යවසායේ ද අයිතිය ලබාගැනීමේ අවස්ථාව ලැබෙන බවත්, ඒවා පෙර කවරදාකටත් වඩා සෞභාග්‍යමත් වීමත්' යයි ලියා තැබීය.

කෙසේ වෙතත් මෙම 'සමෘද්ධිය' අත්කර ගත්තේ, දකුනු අප්‍රිකානු කම්කරුවන් සූරාකෑම උග්‍ර කිරීම මගින් පොහොසත්වූ කලු දශලක්ෂපතියන් තට්ටුවක් නිර්මානය කරන අතර ජාත්‍යන්තර පතල් සමාගම් හා බැංකු වල ලාභය තරකරමිනි.

ඒඑන්සීය අනුගමනය කල නින්දිත පිලිවෙත එයටම සුවිශේෂ වූවක් නොවීය. ඒ කාලය තුලම පලස්තීන විමුක්ති සංවිධානයේ සිට සැන්ඩිනිස්ටාව දක්වාවූ ඊනියා ජාතික විමුක්ති ව්‍යාපාර සැම එකක්ම පාහේ එම පිලිවෙත්ම අනුගමනය කල අතර අධිරාජ්‍යවාදය සමග සිය සාමය පිහිටුවා ගනිමින් තුනී තට්ටුවක් සඳහා ධනය හා වරප්‍රසාද ගොඩගැසූහ.

මෙම සන්දර්භය තුල මැන්ඩෙලාගේ අභාවය සලකුනු කරන්නේ, පන්ති අරගලය හා සමාජවාදී විප්ලවයෙන් පරිබාහිරව දකුනු අප්‍රිකානු කම්කරුවන්ට හා ඒ අර්ථයෙන් ලෝකය පුරා කම්කරු පන්තියට, ඉදිරි මාවතක් නොපවතින්නේය යන කාරනයයි.

ලියොන් ට්‍රොට්ස්කි විසින් විස්තාරනය කල නොනවතින විප්ලවයේ න්‍යාය මත පිහිටාගත් නව පක්ෂයක් ගොඩනැගිය යුතුය. එය පැහැදිලි කලේ, දකුනු අප්‍රිකාව වැනි රටවලදී අධිරාජ්‍යවාදය මත යැපෙන හා පහතින් නැගෙන විප්ලවය ගැන භීතියට පත් ජාතික ධනේශ්වරය, ජනතාව මුහුනදෙන අතිමූලික ප්‍රජාතන්ත්‍රීය හා සමාජ කර්තව්‍යයන් විසඳීමට අසමත් බවය. මෙය කල හැක්කේ අධිරාජ්‍යවාදයට අවසන් තිත තබන හා ලෝක සමාජවාදය ගොඩනංවන ජාත්‍යන්තර අරගලයක කොටසක් ලෙස, සියතට බලය ගෙන ධනවාදය පෙරලා දමන කම්කරු පන්තියට පමනි.

**බිල් වෑන් ඕකන්**

© www.wsws.org